## ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය - 2015

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සම්මේලනයේ යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගතවූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 වංචාකාරී ස්වභාවයක් දෘශ්‍යමාන ගනුදෙනු

වංචාකාරී ලෙස දෘශ්‍යමාන වන පහත සඳහන් ගනුදෙනු පිළිබඳව මාගේ පසුගිය විගණන වාර්තාවලින් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ පාපන්දු සම්මේලනයේ සභාපති මේ වන විටත් අවධානය යොමු කර ඇත. එසේ වුවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් මෙම කරුණු නිරාකරණය වී නොතිබුණි.

(අ) කළුතර ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම වෙනුවෙන් ඉතාලි පාපන්දු ක්‍රීඩකයන්ගේ සංගමය විසින් 2008 ජනවාරි 08 දින යුරෝ 40,400 ක් එනම් රු.6,287,670 ක් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට පරිත්‍යාග කර තිබුණු අතර, පසුව එම මුදල් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ඇති නිල බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. අනතුරුව හිටපු විධායක නිලධාරි විසින් එම මුදල් කොල්ලුපිටියේ පිහිටි පෞද්ගලික බැංකු ගිණුමකට මාරු කරන ලෙස ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත ලිපියක් මගින් දන්වා තිබුණි.

ඒ අනුව ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව විසින් රු. 6,287,670 ක් එම පෞද්ගලික බැංකු ගිණුම වෙත මාරු කර තිබුණු අතර, අදාල බැංකු ගිණුමේ නියම අයිතිකරු එවකට සම්මේලනයේ කළමනාකරණ කමිටු සභාපතිවරයාගේ බව විගණනයේදී තහවුරු විය. මේ අනුව ඉතාලි පාපන්දු ක්‍රීඩකයින්ගේ සංගමය මගින් ප්‍රදානය කළ රු. 6,787,670 (€ 40,400) ක මුදල කළමනාකරණ මණ්ඩලයේ සභාපති විසින් අවභාවිතා කර ඇති බවට විගණනයේදී තහවුරු විය.

(ආ) ආසියානු පාපන්දු සම්මේලනයේ සභාපති කුසලාන තරගාවලියේ පළමු වටයේ සුදුසුකම් ලැබීමේ තරග පැවැත්වීම සඳහා ආසියානු පාපන්දු සම්මේලනය මගින් 2008 මැයි 12 දින ඇමෙරිකානු ඩොලර් 60,000 ක් එනම් රු. 6,415,290 ක් ප්‍රදානය කර තිබුණු අතර එය ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ඇති නිළ බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි.

මේ පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂණ මගින් අනාවරණය වී ඇති පරිදි හිටපු ප්‍රධාන විධායක නිලධාරියා විසින් එම මුදල අදාල තරගාවලියේ සත්කාරකත්වය දරන පෞද්ගලික ක්‍රීඩා සංගමයට කොටහේන ශාඛාවේ පෞද්ගලික බැංකුවක පවත්වා ගෙන යන බැංකු ගිණුමකට මාරු කරන ලෙස 2008 මැයි 14 දින මූල්‍ය අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබාදී තිබුණි.

කෙසේ වෙතත් අදාල ගිණුම් අංකය යටතේ එවැනි බැංකු ගිණුමක් පවත්වා නොගන්නා නිසා මෙම ඉල්ලීම බැංකුව වෙත ඉදිරිපත් නොකර එම අවස්ථාවේදීම හිටපු කළමනාකරණ කමිටු සභාපතිවරයාගේ කොල්ලුපිටිය ශාඛාවේ පෞද්ගලික බැංකුවක පවත්වා ගෙන යන පෞද්ගලික විදේශ මුදල් බැංකු ගිණුමකට එම මුදල මාරු කරන ලෙස ඔහු විසින් කූට ලෙස පිළියෙල කළ නියෝග ලිපියක් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත යවා තිබුණි.

ඒ අනුව ඉහත මුදල, ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව මගින් එම ගිණුමට මාරු කර තිබුණු අතර, අදාල මුදල් මෙතෙක් එම ක්‍රීඩා සමාජය වෙත ලබාදී නොමැති බව විගණනයේදී තහවුරු විය.

(ඇ) කළුතර ප්‍රදේශයේ සුනාමි ව්‍යසනයෙන් හානියට පත් වූ නිවාස 20 ක් ඉදිකිරීම වෙනුවෙන් පෞද්ගලික සමාගමක් විසින් සම්මේලනය වෙත එකතුව රු. 10,000,000 ක මුදලක් 2006 ජනවාරි 23 දින ප්‍රදානය කර තිබුණි.

Educate a Child Project' හි අරමුදල් යෙදවීම සඳහා පෞද්ගලික බැංකුවක පවත්වා ගෙන යන ගිණුමකට මුදල් ලබාදෙන ලෙස හෙල්ප් ශ්‍රී ලංකා කොන්සෝටියම් භාණ්ඩාගාරික විසින් සිදු කළ ඉල්ලීම අනුව එම මුදලින් රු.5,000,000 අදාල ගිනුමට 2006 ජනවාරි 26 දින මාරුකර තිබුණි.

2007 පෙබරවාරි 05 දින, සම්මේලනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී විසින් ඉතිරි රු.5,000,000 ක මුදල සුනාමි ව්‍යාපෘතියේ භාවිතය සඳහා පෞද්ගලික පුණ්‍යායතනයක භාණ්ඩාගාරික වෙත භාරදිය හැකිවන පරිදි හිටපු කළමනාකරණ කමිටු සභාපති වෙත මුදලින් ගෙවන ලෙස දන්වා තිබුණි. ඒ අනුව, හිටපු කළමනාකරණ කමිටු සභාපති වෙත එම මුදල් භාරදී තිබුණද ඔහු විසින් පුණ්‍යායතනය වෙත ලබානොදී වංචාකාරී ලෙස අත රදවා ගෙන තිබුණි.

(ඇ) ආසියානු පාපන්දු සම්මේලනය විසින් 2008 වර්ෂයේදී එකතුව ඇමෙරිකානු ඩොලර් 200,000 ක් සම්මේලනයට අයත් කොළඹ 01 පිහිටි ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකු ශාඛාවේ බැංකු ගිණුමක තැන්පත් කර තිබූ අතර සම්මේලනය විසින් එම මුදලින් එකතුව ඇමෙරිකානු ඩොලර් 40,000 ක් හිටපු කළමනාකරණ කමිටු සභාපතිගේ කොළඹ 03 පිහිටි විදේශ බැංකු ශාඛාවක ගිණුමකට වංචාකාරී ලෙස මාරු කර තිබුණි.

2008 ජුනි 06 දින හිටපු ප්‍රධාන විධායක නිලධාරී විසින් ඇමෙරිකානු ඩොලර් 30,000 කට සමාන එකතුව රු. 3,217,500 ක් සම්මේලනයේ බැංකු ගිණුමෙන් ලබා ගෙන තිබුණි. මෙම මුදලින් රු. 1,337,151 ක් සහ රු. 526,250 ක් ලෙස ඇමෙරිකානු ඩොලර් 17,467 කට සමාන මුදලක් පිළිවෙලින් 2008 ජුනි 19 දින හා 2008 ජූලි 22 දින සම්මේලනය වෙත භාරදී තිබූ අතර, ඉතිරි රු. 1,337,035 කට සමාන ඇමෙරිකානු ඩොලර් 12,533 මෙම වාර්තවේ දිනය වන විටත් සම්මේලනයට භාරදී නොතිබුණි.

තවදුරටත් හිටපු ප්‍රධාන විධායක නිලධාරී විසින් දකුණු ආසියානු පාපන්දු තරඟාවලියේ (SAFF GAMES) වියදම් දැරීම සඳහා විධායක කමිටුවේ අනුමැතියකින් තොරව සම්මේලනයේ බැංකු ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් තිබියදී 2008 ජුනි 20 දින හිටපු කළමනාකරණ මණ්ඩල සභාපතිගෙන් එකතුව රු. 6,000,000 ක් ණයක් ලෙස ලබාගෙන තිබුණි. එම ණය මුදල නිරවුල් කිරීම සඳහා එම කාලය තුලදීම සම්මේලනයේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී විසින් කූට ලෙස පිළියෙල කළ බැංකු විධානයක් මගින් හිටපු කළමනාකරණ මණ්ඩල සභාපතිගේ පෞද්ගලික බැංකු ගිණුමකට ඇමෙරිකානු ඩොලර් 60,000 ක් සම්මේලනයේ බැංකු ගිණුමෙන් මාරු කර තිබුණි.

### 2.2.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>වාර්තාකරණ දිනට පසු සිදුවීම්</u>
ප්‍රමිතියේ 32.9 වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශ නිකුත්කිරීම සඳහා අනුමැතිය ලබාදුන් දිනය සම්මේලනය විසින් අනාවරණය කර නොතිබුණි.

(ආ) <u>මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්</u>
සම්මේලනය විසින් 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.154,577,236 ක විලම්භිත ආදායම හඳුනා ගැනීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනාවරණය කර නොතිබුණි.

(ඇ) <u>සංකල්ප සහ විස්තරාත්මක ප්‍රතිපත්ති</u>
ප්‍රමිතියේ 2.52 වගන්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ රු. 32,317,253 ක ආදායම ස්වකීය වියදමට එරෙහිව හිලව්කර තිබුණි.

(ඈ) <u>මූල්‍ය ආදායම් හඳුනා ගැනීම</u>
ප්‍රමිතියට අනුව දළ පදනමට මූල්‍ය ආදායම හඳුනා ගත යුතු වුවත් රු.1,653,079 ක මූල්‍ය ආදායම රඳවා ගැනීම් බදු අඩුකොට ශුද්ධ පදනමට හඳුනාගෙන තිබුණි.

(ඉ) <u>විශ්‍රාම ප්‍රතිලාභ වගකීම</u>
සම්මේලනය විසින් සේවය ආරම්භක දිනයේ සිට එක් එක් වර්ෂය සඳහා මාස භාගයක වැටුප මත පදනම්ව රු. 4,692,750 ක විශ්‍රාම ප්‍රතිලාභ වගකීමක් ගිණුම්ගත කර තිබුණි. එසේ වුවද, ප්‍රමිතියට අනුව, එහි සැලසුම් කළ වත්කම් අගය හිලව්කර, එහි වගකීමෙහි වර්තමාන වටිනාකමට හඳුනා ගත යුතුය.

එසේම, සමස්ථ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් වටිනාකම ජංගම වගකීම් ලෙස හඳුනා නොගෙන ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර තිබුණි.

(ඊ) <u>**දේපළ පිරියත හා උපකරණ**</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, වටිනාකම රු. 9,900,000 ක් වන කල්බදු වත්කම් දෙකක් සින්නක්කර වත්කම් ලෙස හඳුනාගෙන තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපා නොතිබුණි. එමෙන්ම, ප්‍රමිතියේ 17.20 වගන්තියට පටහැනිව, සම්මේලනය විසින් වත්කම් උපලබ්ධිකරණ වර්ෂයේදී සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂයවීම් කරනු ලබන අතර, වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂයවීම් සඳහා වෙන්කිරීම් නොකෙරේ.

2.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාගේ පසුගිය විගණන වාර්තා මඟින්ද අඛණ්ඩව පෙන්වා දී තිබුණද, සම්මේලනය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම්වල සම්පූර්ණත්වය, අයිතිය, පැවැත්ම සහ වටිනාකම තහවුරු කර ගැනීමට අදාල සහායක ලියවිල්ලක් ලෙස භෞතික සත්‍යාපන වාර්තාවක් වසර කීපයක සිට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු. 251,243,332 ක ස්ථාවර වත්කම්වල ධාරණ අගයෙහි නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ආ) අදාල තහවුරු ලියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු. 154,577,236 ක විලම්භිත ආදායම සහ සමාලෝචිත වර්ෂය සඳහා විලම්භිත ආදායමෙහි ක්‍රමක්ෂය රු. 8,291,439 ක නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.3 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

---------------------------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති, රෙගුලාසි හා කළමනකාරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 756 | සම්මේලනය විසින් සියළු දෙපාර්තමේන්තුවලට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | සියළුම ගුවන් ටිකට්පත් බීඕසී ට්‍රැවල්ස් සමාගම හෝ පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම හරහා ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් හෝ මිහින් ලංකා ගුවන් සමාගමෙන් මිලදී ගත යුතු වුවත් ඊට පටහැනිව පෞද්ගලික ආයතනයකින් රු.7,846,101 ක් වටිනා ගුවන් ටිකට්පත් මිලදී ගෙන තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2006 ජනවාරි 26 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ චක්‍රලේඛය (රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006) | සංවිධානය විසින් කැළණිය පාපන්දු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථම එහි පාරිසරික හා සමාජීය බලපෑම් පිළිබඳව කිසිදු අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. එසේම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙන තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සම්මේලනයේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.30,696,894 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,310,952 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 36,007,756 ක වර්ධයනයක් පෙන්නුම් කෙරුණි. ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයෙන් ලද අරමුදල් රු. 72,440,986 කින් ඉහළ යාම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්වල දුර්වලතා**

4.1.1 **මානව සම්පත් කළමනාකරණය**

එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය දක්වමින් සම්මේලනය විසින් මානව සම්පත් අයවැයක් හා සංවිධාන ව්‍යුහයක් සහිත අනුමත කාර්ය මණ්ඩලයක් තිබිය යුතු බව මාගේ පසුගිය විගණන වාර්තා මගින්ද පෙන්වාදී තිබුණද සම්මේලනය ආරම්භයේ සිටම අනුමත කාර්ය මණ්ඩලයක් සහ සංවිධාන ව්‍යුහයක් නොතිබුණි.

4.1.2 **විදේශ පුහුණු කරුවෙකු බඳවා ගැනීම**

ජාතික පාපන්දු කණ්ඩායමට පුහුණු පහසුකම් සැපයීම වෙනුවෙන් සම්මේලනය විසින් 2014 ජුනි 01 දින සිට 2016 මැයි 31 දින දක්වා වසර දෙකක කාල පරිච්ඡේදයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත විදේශ පුහුණුකරුවකු බඳවා ගෙන තිබුණු අතර, අදාල කොන්ත්‍රාත් කාලයේ ප්‍රථම වර්ෂය සඳහා ගාස්තු ලෙස එකතුව රු. 7,428,047 ක් එම පුහුණුකරු වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳ පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පුහුණුකරු බඳවා ගැනීමේදී සම්මේලනය විසින් තාක්ෂණික පිරිවිතර පිළිබඳ සැලකිල්ලක් දැක්වූ බවට සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) සම්මේලනය විසින් මෙම බඳවා ගැනීමේදී සම්මත මිලදී ගැනීමේ ක්‍රියාපරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ඇ) පුහුණුකරු බඳවා ගැනීමෙන් අනතුරුව ජාතික පාපන්දු කණ්ඩායමේ සැලකිය යුතු වර්ධනයක් නිරීක්ෂණය නොවූ අතර, අදාල කාලය තුල කිසිදු ජාත්‍යන්තර තරග ජයග්‍රහණයක් ද ලබා නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් කාලයට වසරකට පෙර එනම් 2015 මැයි 31 දින පුහුණුකරු රටින් පිටවී ගොස් තිබුණි.

**4.1.3 පාසැල් මට්ටමේ පාපන්දු ක්‍රීඩාව වර්ධනය**

පාසැල් මට්ටමේ පාපන්දු ක්‍රීඩාව සංවර්ධනය කිරීම සඳහා සම්මේලනය විසින් කිසිදු අවධානයක් දක්වා නොමැති බව නිරීක්ෂණය වූ අතර, මෙම අරමුණ වෙනුවෙන් කිසිදු ව්‍යාපෘතියක්ද හඳුන්වා දී නොතිබුණි. ශ්‍රී ලංකාව තුල පාපන්දු ක්‍රීඩාව වර්ධනයට පාපන්දු සංගම් හා ලීග් පදනම් කරගෙන සියළු උත්සාහයන් දරා තිබුණද සම්මේලනයේ ඍජු මැදිහත්වීම තුලින් පාසැල් පාපන්දු සංවර්ධන වැඩසටහනක් හඳුන්වාදීම වැදගත් බව නිරීක්ෂණය විය.

**4.1.4 ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා**

සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය තුල රු. 35,642,355 ක වටිනාකමකින් යුතු භාණ්ඩ හා සේවා මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධව පහත නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හෝ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමකින් තොරව සම්මේලනය විසින් රු.4,167,100 ක් වටිනා ක්‍රීඩා ඇඳුම් කට්ටල මිලදී ගෙන තිබූ අතර, එම සියළු අයිතම මිලදී ගෙන තිබුණේ තෝරා ගත් සැපයුම්කරුවන් දෙදෙනෙකු මගින් පමණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී සම්මේලනය විසින් ආහාර, කෙටි කෑම සහ නවාතැන් පහසුකම් යනාදිය මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවන පරිදි රු. 30,985,277 ක් වැයකර තිබුණු අතර, මේ සඳහා විධිමත් ක්‍රමවේදයක් හෝ හඳුන්වා දී නොතිබුණි. එසේම සැපයුම්කරුවන් දෙදෙනෙකුගෙන් අදාල සේවාව ලබා ගැනීම සඳහා විවෘත චෙක්පත් 170 කට වඩා වැඩි ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර, එමගින් සම්මේලනයේ මුදල් අවභාවිතා කිරීමට අවස්ථාවක් සැලකිය හැකිබව විගණනයේදී අදහස් කෙරේ.

**4.1.5 පාපන්දු ලීග් සහ සංගම් කළමනාකරණය**

සම්මේලනය විසින් ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය මගින් ලබාදුන් ප්‍රදාන උපයෝගී කරගෙන සමාලෝචිත වර්ෂයේදී දිවයින පුරා ඇති පාපන්දු ලීග් සහ සංගම් 102 ක් වෙත එකතුව රු. 18,267,500 ක අරමුදල් ලබාදී තිබුණි. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පාපන්දු ලීග් සහ සංගම් වෙතින් කිසිදු වැඩ සැලැස්මක් හෝ මූල්‍ය යෝජනාවන් ලබාගැනීමකින් තොරව අරමුදල් ප්‍රදානය කර තිබුණි.

(ආ) සමහර පාපන්දු ලීග් හා සංගම් වෙත ප්‍රදානය කරන ලද සම්පූර්ණ අරමුදල් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට උපයෝගී කරගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර, අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝගී කරගත්තේද යන්න තහවුරු කර ගැනීමට කිසිදු පසුවිපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) පාපන්දු සම්මේලනයේ පොදු ප්‍රතිපත්තියට අනුව පාපන්දු ලීගයක් සඳහා අවම වශයෙන් පාපන්දු සංගම් 05 ක් තිබිය යුතුය. එසේ වුවද, ලීග් 17 ක් අදාල ප්‍රතිපත්තියට අනුකූල නොවන බව විගණන පරීක්ෂා වලදී අනාවරණය විය.

**5. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

අනාගත මගපෙන්වීම්ද, දැක්ම සහ මෙහෙවර, අරමුණු, වර්තමානයේ පවතින සම්පත් සහ ආයතනික ව්‍යුහය ආදී කරුණු ඇතුලත් කර වසර තුනකට වැඩි කාලයක් ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් සම්මේලනය විසින් එහි ආරම්භයේ සිටම පිළියෙල කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

කළමනාකරුවන්ගේ වගකීම හඳුනාගනිමින් කාලපරිච්ඡේදය තුල ලගාකර ගත යුතු අරමුණු හා ඉලක්ක ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භවීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද, සම්මේලනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**5.4 අභ්‍යන්තර විගණනය**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර සම්මේලනයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
2013 වර්ෂයට හෝ ඊට පෙර ලියාපදිංචි වූ සියළුම පාපන්දු ලීග් සහ සංගම් සඳහා වාර්ෂිකව ගෙවිය යුතු රු.250,000 ක් ගිණුම්ගත කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි.

(ආ) අත්තිකාරම් ගෙවීම හා පියවීම සම්බන්ධ පාලනය